# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2369/11 – 2024 ජනවාරි මස 30 වැනි අඟහරුවාදා – 2024.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

1. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ඨාස අංක 206 A ඇලෙක්සැන්ඩ්‍රා වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හොන්කාසල්වත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/JAE/2020/375 හා 2020.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

2. **පරවශතාවේ විස්තරය.**– කැළණි ගඟ දකුණ ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතියේ කඩවත සිට ඒකල ජල ටැංකිය දක්වා ප්‍රධාන ජල සම්ප්‍රේෂණ නල මාර්ග එළීම සඳහා ජා ඇල දකුණු ඉවුරෙන් ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීම.

01. කැබලි අක්ෂර 'A' – ගවර්මන්ට් සිනමන් ගාර්ඩන් *හෙවත්* කණුවනවත්ත *හෙවත්* හොන් කාසල්වත්ත – **ප්‍රමාණය: හෙක්.** 0.0218

උතුරට: රවි මොරායස් හිමිකම් කියන ගවර්මන්ට් සිනමන් ගාර්ඩන් *හෙවත්* කණුවනවත්ත *හෙවත්* හෝන් කාසල්වත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: රවි මොරායස් හිමිකම් කියන ගවර්මන්ට් සිනමන් ගාර්ඩන් *හෙවත්* කණුවනවත්ත *හෙවත්* හෝන් කාසල්වත්ත; දකුණට: රවි මොරායස් හිමිකම් කියන ගවර්මන්ට් සිනමන් ගාර්ඩන් *හෙවත්* කණුවනවත්ත *හෙවත්* හෝන් කාසල්වත්ත සහ ජා ඇල (ඌරුවල ඔය); බටහිරට: රවි මොරායස් හිමිකම් කියන ගවර්මන්ට් සිනමන් ගාර්ඩන් *හෙවත්* කණුවනවත්ත *හෙවත්* හෝන් කාසල්වත්ත.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/18/2019/WS/606.
2022 නොවැම්බර් මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 - 0226

1A – G 041325 – 10 (2024/01)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*